# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2428/43 - 2025 මාර්තු මස 20 වැනි බ්‍රහස්පතින්දා - 2025.03.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

එල්.ඩී.බී. 7/2023

**2023 අංක 9 දරන දූෂණ විරෝධී පනත**

2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ 82 වන වගන්තිය සහ 92 වන වගන්තිය සමග කියවිය යුතු 156 වන වගන්තිය යටතේ, අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාවේ උපදෙස් මත අධිකරණ හා ජාතික ඒකාබද්ධතා අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

**හර්ෂණ නානායක්කාර,**
අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍ය.

2025 මාර්තු මස 19 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මේ නියෝග 2025 දූෂණ විරෝධී (වත්කම් හා බැරකම් ප්‍රකාශ) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. පනතේ II වන කොටස අදාළ වන සෑම තැනැත්තකුම මෙහි උපලේඛනයේ දක්වා ඇති ආකෘති පත්‍රයේ දක්වා ඇති ආකාරයට වත්කම් හා බැරකම් ප්‍රකාශ කරනු ලැබිය යුතු ය.

3. මේ නියෝගවල කාර්යය සඳහා, ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් බැහැරව, සෘජුව හෝ අර්ථදායක ලෙස හිමි වත්කම්, බැරකම්, ආදායම්, වියදම් සහ පොලී මුදල් පිළිබඳ විස්තර මෙහි උපලේඛනයේ ආකෘති පත්‍රයේ දක්වා ඇති අවශ්‍ය සහ නිශ්චය කරන ආකාරයට සපයනු ලැබිය යුතු ය.

4. මේ නියෝගවල "පනත" යන්නෙන් 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනත අදහස් වේ.


1A - PG 7060 — 354 (2025/03)


*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**උපලේඛනය**

**(2 වන නියෝගය)**

**ආකෘති පත්‍රය**

**වත්කම් සහ බැරකම් ප්‍රකාශය**

**(2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ 82 වන වගන්තිය යටතේ වන)**

(1) මුලකුරු සමග නම:

(2) ප්‍රකාශ වර්ගය සහ වර්ෂය (වාර්ෂික ප්‍රකාශය/ පළමු පත්වීම් ප්‍රකාශය/ ධුර කාලය අවසානයේ දී හෝ විශ්‍රාම යාමේ දී සිදු කරනු ලබන ප්‍රකාශය/ පශ්චාත් විශ්‍රාම ප්‍රකාශය/ තත්කාර්ය ප්‍රකාශය/ මැතිවරණ ප්‍රකාශය)

(3) ඉදිරිපත් කළ දිනය:

(4) ආයතනය සහ තනතුර:

<u>ප්‍රකාශය සිදු කරන තැනැත්තාගේ පුද්ගලික තොරතුරු</u>

| 1. ප්‍රකාශය සිදු කරන තැනැත්තාගේ පෞද්ගලික තොරතුරු | |
|---|---|
| සම්පූර්ණ නම | |
| ඔබගේ නම ඔබ විසින් පසුගිය වසරේ දී වෙනස් කර ඇත්නම් කරුණාකර ඔබේ පෙර පැවති සම්පූර්ණ නම සඳහන් කරන්න | |
| උපන් දිනය *(දිනය/මාසය/වර්ෂය)* | |
| ස්ත්‍රී පුරුෂ භාවය *(ස්ත්‍රී/පුරුෂ/වෙනත්)* | |
| ජාතික හැඳුනුම්පත් අංකය *(ජා.හැ.අං.)* | |
| විදේශ ගමන් බලපත්‍ර අංකය | |
| බදු ගෙවන්නා හඳුනා ගැනීමේ අංකය | |
| ඔබ ද්විත්ව පුරවැසිභාවය හිමි අයෙක් ද? පිළිතුර ඔව් නම්, එම රටේ විදේශ ගමන් බලපත්‍ර අංකය සඳහන් කරන්න. | |
| පුද්ගලික විද්‍යුත් ලිපිනය සහ සම්බන්ධ කර ගත හැකි දුරකථන අංකය/අංක *(ජංගම හා ස්ථාවර)* | |
| රාජකාරී විද්‍යුත් ලිපිනය සහ සම්බන්ධ කර ගත හැකි දුරකථන අංකය/ අංක *(ජංගම හා ස්ථාවර)* | |
| රාජකාරී ලිපිනය | |
| වත්මන් පදිංචිය සහිත ලිපිනය | |
| ස්ථිර පදිංචිය සහිත ලිපිනය | |

*සටහන්*

(1) 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනත (මෙහි මින් මතු "පනත" යනුවෙන් හඳුන්වනු ලබන) මගින් නම් කරන ලද රජයේ තනතුරු දරන නිලධරයන්, මැතිවරණ අපේක්ෂකයින් සහ පනතේ 80 වන වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් කරන ලද තැනැත්තන්, ශ්‍රී ලංකාව තුළ සහ ඉන් බැහැරව පවතින ඔවුන්ගේ වත්කම් සහ බැරකම් පිළිබඳ ප්‍රකාශ කලින් කලට ඉදිරිපත් කළ යුතු ය. මෙම වත්කම් සහ බැරකම් ප්‍රකාශයට -

*(ඇ)* (මෙහි මින් මතු "ප්‍රකාශකයා" යනුවෙන් හඳුන්වනු ලබන) ප්‍රකාශය සිදු කරන තැනැත්තාගේ වත්කම් සහ බැරකම්;

*(ආ)* ඔහුගේ කලත්‍රයාගේ වත්කම් සහ බැරකම්;

*(ඇ)* ඔහුගෙන් යැපෙන එක් එක් දරුවන්ගේ වයස නොසලකා එම එක් එක් දරුවන්ගේ සියලු වත්කම් හා බැරකම්;

*(ඈ)* ඔවුන්ගේ වයස නොසලකා ඔහුගෙන් යැපෙන වෙනත් තැනැත්තන්ගේ සියලු වත්කම් සහ බැරකම්; *සහ*

*(ඉ)* ඒ තැනැත්තා පනතේ II වන කොටසට අදාළ වන තැනැත්තා සමග අන්‍යෝන්‍ය අයිතිවාසිකම් සහ බැඳීම් හුවමාරු කර නොගන්නා අවස්ථාවක දී හැර, ප්‍රකාශයේ දිනයට අවම වශයෙන් මාස හයකටවත් පෙරාතුව මේ කොටස අදාළ වන තැනැත්තා සමග පොදු නිවසක සහවාසයෙන් ජීවත්වන විට දී එකී වෙනත් යම් තැනැත්තාගේ සියලු වත්කම් සහ බැරකම්,

ඇතුළත් විය යුතු ය.

(2) (1) වන සටහනේ (අ), (ආ), (ඇ), (ඈ) සහ (ඉ) හි හඳුන්වනු ලබන තැනැත්තන්, මෙම ආකෘති පත්‍රය තුළ මින් ඉදිරියට "ආවරණය වන තැනැත්තන්" යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු ය.

(3) මෙම වත්කම් සහ බැරකම් ප්‍රකාශය, පනතේ II වන කොටසේ විධිවිධානවලට යටත්ව, පහත වගුවේ දක්වා ඇති ඕනෑම එක් හේතුවක් සඳහා ගොනු කිරීමට අවශ්‍ය වේ. කරුණාකර පහත උචිත කොටුව සලකුණු කිරීමෙන් හේතුව තහවුරු කරන්න.

(4) අදාළ වත්කම් සහ බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කිරීමට අපොහොසත් වීම, අවශ්‍ය සියලු වත්කම් සහ බැරකම් ඇතුළත් කිරීමට අපොහොසත් වීමට හෝ වත්කම් බැරකම් ප්‍රකාශ තුළ අසත්‍ය ප්‍රකාශයක් සිදු කිරීම ඇතුළුව පනතේ II වන කොටසේ අවශ්‍යතාවයන්ට අනුගත වීමට අපොහොසත් වීම, පනතේ 90 වන වගන්තිය යටතේ වරදක් වන අතර ප්‍රකාශයට ඇතුළත් කළ යුතු එහෙත් ප්‍රකාශයෙන් ඉවත් කරන ලද ඕනෑම වත්කමක් රජය සතු විය යුතු ය.

(5) ඔබ වත්කම් සහ බැරකම් ප්‍රකාශයක් ගොනු කළ යුතු තැනැත්තකු නොවේ යැයි ඔබ සිතන්නේ නම් හෝ ඔබ විසින් ප්‍රකාශය තුළ සඳහන් කළ යුත්තේ කුමන තොරතුරු ද යන්න පිළිබඳ යම් ගැටළුවක් ඇත්නම්, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව අමතන්න.
දුරකථන අංකය ៖ 011 2596359; 076 7011954;
විද්‍යුත් ලිපිනය assests@ciaboc.gov.lk; වෙබ් අඩවිය: www.ciaboc.gov.lk

| 2. වත්කම් සහ බැරකම් ප්‍රකාශය සිදු කළ යුතු අවස්ථා | | | |
|---|---|---|---|
| ප්‍රකාශය ඉදිරිපත් කිරීමට හේතුව (උචිත කොටුව සලකුණු කරන්න) | | ප්‍රකාශ කළ යුතු දිනය | |
| (i) | රාජ්‍ය සේවයේ පත්වීමක් ලැබීම (පළමු පත්වීම) | පත්වීම ලබා මාස තුනක් ඇතුළත | |
| (ii) | රාජ්‍ය නිලධාරියකු ලෙස සේවය කරන අතරතුර වාර්ෂිකව (වාර්ෂික) | සෑම වර්ෂයකම මාර්තු 31 වැනි දින | |
| (iii) | රාජ්‍ය සේවය හැරයාමේ දී (ධුර කාලය අවසානය) | රාජ්‍ය සේවය හැර යාමෙන් දින 14 ක් ඇතුළත | |
| (iv) | හිටපු රාජ්‍ය නිලධාරියකු වීම (විශ්‍රාම ගැනීමෙන් පසු) | ධුර කාලය අවසන් වීමෙන් පසු අනුගාමී වසර දෙකකින් වත්කම් සහ බැරකම් ප්‍රකාශ කිරීම | |
| (v) | ජනාධිපතිවරණය, පාර්ලිමේන්තු, පළාත් සභා හෝ පළාත් පාලන ආයතනයක අපේක්ෂකයකු වීම (මැතිවරණ) | නාම යෝජනා පත්‍රය ඉදිරිපත් කිරීමේ දී | |
| (vi) | රු. මිලියන 10ක් හෝ ඊට වැඩි වත්කම්/ බැරකම්වල වෙනසක් සිදු වීම (තත්කාර්යය) | මාසයක් ඇතුළත | |

**පොදු උපදෙස්:**

(1) සියලු ම දිනයන් සඳහන් කිරීමේ දී දිනය/මාසය/වර්ෂය යන ආකෘතියට අනුව ද වර්ෂය ඉලක්කම් හතරක් සහිතව ද සඳහන් කළ යුතු ය.

(2) වත්කම් සඳහන් කිරීමේ දී, එය මිල දී ගැනීමක් ද, රික්තිවරණයක් ද, ත්‍යාගයක් ද හෝ වෙනත් ආකාරයකින් ලද දෙයක් ද යන්න පිළිබඳව සඳහන් කරන්න. වෙනත් ආකාරයකින් අත්පත් කර ගත් දෙයක් නම් ඒ කෙසේ ද යන්න පැහැදිලි කරන්න. ප්‍රසිද්ධියේ වෙළෙඳාම් කරන ලද සුරැකුම්පත් හැර, මිල දී ගත් අනෙත් සියලු වත්කම් මිල දී ගත් මුදල සඳහන් කර, ප්‍රකාශය ඉදිරිපත් කරන අවස්ථාව වන විට ඒවායේ වටිනාකම පිළිබඳ සද්භාවීය ඇස්තමේන්තු අගයක් සඳහන් කරන්න.

(3) ආවරණය වන තැනැත්තකු විසින් දරනු ලබන වත්කම් සඳහන් කිරීමේ දී, ශ්‍රී ලංකාවේ හෝ විදේශයන් හි දරනු ලැබූ වත්කම් ඇතුළත් කරන්න. හිමිකම සඳහන් කිරීමේ දී ආවරණය වන පුද්ගලයාගේ නමින් නීත්‍යානුකූලව හිමිකම් කියන හෝ ලියාපදිංචි කර ඇති ඕනෑම වත්කමක් පමණක් නොව, හවුල් හිමිකාරිත්වය හෝ භුක්තිය ඇතුළුව ප්‍රකාශකයාට ප්‍රතිලාභයක් හෝ භාවිතයක් ඇති ඕනෑම දේපළක් ඇතුළත් කරන්න. උදාහරණයක් ලෙස, ආවරණය වන තැනැත්තා විසින් සැලකිය යුතු කාලයක් පදවන මෝටර් රථයක් හෝ ආවරණය වන තැනැත්තා සැලකිය යුතු කාලයක් ගත කරන නිවසක් හෝ බද්ධ නිවසක් දැක්විය හැකි ය.

<u>ආවරණය වන තැනැත්තන්ගේ වත්කම් සහ බැරකම් පිළිබඳ විස්තර</u>

1. ප්‍රකාශකයාට අමතරව ආවරණය වන තැනැත්තන් පිළිබඳ තොරතුරු

| ආවරණය වන තැනැත්තාගේ වාසගම සහ වෙනත් නම් | උපන් දිනය | ජාතිය | ආදායම් බදු අංකය | ජාතික හැඳුනුම්පත් අංකය (ජා.හැ.අං) | විදේශ ගමන් බලපත්‍රය | වර්තමාන ලිපිනය | ස්ථිර ලිපිනය |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

2. ආවරණය වන තැනැත්තන් විසින් දරනු ලැබූ නිශ්චල දේපළ

| ආවරණය වන තැනැත්තා | වර්ගය* | වර්ගඵලය/ අවකාශය (වර්ග අඩි/අක්කර/ පර්චස්) | ලිපිනය | අත්කරගත් දිනය, අත්කරගත් අයිතිවාසිකම් (අයිතිය, බද්ද හෝ වෙනත් භාවිත කිරීමේ හෝ භුක්ති විඳීමේ අයිතිය) ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංකය | අත්පත්කරගත් ආකාරය (තෑගි හෝ මිලදී ගැනීම ආදී) | වටිනාකම | සම අයිතිකරුවකුගේ හෝ දේපළෙහි අයිතිවාසිකම් ඇති වෙනත් නෛතික හෝ ස්වභාවික තැනැත්තකුගේ නම |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

* (1) ඉඩම් කට්ටිය; (2) නේවාසික ගොඩනැගිල්ල; (3) බද්ධ නිවාස; (4) කාර්යයාලය; (5) වාණිජ ගොඩනැගිල්ල; (6) ගරාජය; (7) ගබඩාව; (8) වෙනත් (නිශ්චිතව සඳහන් කරන්න.)

3. **චංචල දේපළ**

**ප්‍රකාශයට පත්කළ යුතු දේපළ:** රුපියල් ලක්ෂ පහක් (රු. 500,000.00) ඉක්මවන වටිනාකමකින් යුතු චංචල දේපළ. චංචල දේපළ යන්නෙන්, ආරක්ෂක තැන්පතු සේප්පු (හඳුනාගැනීමේ අංකය) ඇතුළුව හානිවීමකින් තොරව ගෙන යා හැකි යම් ද්‍රව්‍යමය අයිතිමයක් අදහස් වේ.

**ප්‍රකාශයේ මේ කොටස තුළ පහත දැක්වෙන දේපළ ප්‍රකාශයට පත් නොකළ යුතු ය:-**

සුරැකුම්පත්; ආයතනික අයිතිවාසිකම්; මුදල්; බැංකු සහ වෙනත් මූල්‍ය ආයතනවල ගිණුම්වල ඇති මුදල්; (බැංකුවක වන) වටිනා ලෝහ සහ මුදල් ආකාරයෙන් ලද ත්‍යාග

| ආවරණය වන තැනැත්තා | වර්ගය | බර සහ/හෝ ප්‍රමාණය | ලක්ෂණ | | අත්කර ගත් දිනය සහ අත්කර ගත් ආකාරය | වටිනාකම | (දේපළට සම අයිතිය ඇත්නම්) සම අයිතිකරු-වන්ගේ තොරතුරු එක් එක් සම අයිතිකරුට අයිති ප්‍රතිශතය ඇතුළත් කරන්න (ස්වභාවික තැනැත්තා හෝ නෛතික තැනැත්තා) | (සන්තකයේ තබා ගැනීමේ හෝ පාවිච්චි කිරීමේ අයිතිය යටතේ දේපළ අත්කරගෙන ඇත්නම්) දේපළෙහි අයිතිකරු පිළිබඳ තොරතුරු (ස්වභාවික තැනැත්තා හෝ නෛතික තැනැත්තා) |
|---|---|---|---|---|---|---|---|---|
| | | | අයිතියේ වර්ගය | වෙළඳ ලකුණ හෝ නිෂ්පාදකයාගේ නම | | | | |
| | | | | | | | | |

* (1) පෞරාණික භාණ්ඩ; (2) සිතුවම්; (3) රන්, රිදී, ප්ලැටිනම් හෝ වෙනත් යම් වටිනා ලෝහ; (4) ඔරලෝසු; (5) වෙනත් ස්වර්ණාභරණ (නිශ්චිතව සඳහන් කරන්න; (6) මුද්දර එකතු; (7) කාසි සහ; (8) රුපියල් දෙලක්ෂ පනස් දහස නොඉක්මවන වටිනාකමකින් යුතු (රු. 250,000.00) මැණික්, දියමන්ති හෝ වෙනත් යම් වටිනා පාෂාණ මෙම කොටස යටතේ ප්‍රකාශයට පත්කළ යුතු ය.

4. චංචල දේපළ - වාහන

**ප්‍රකාශයට පත්කළ යුතු දේපළ:** වටිනාකම කුමක් වුව ද වාහන සහ වෙනත් ස්වයං-චලිත යන්ත්‍ර සහ යාන්ත්‍රණ

| ආවරණය වන තැනැත්තා | වර්ගය* | අයිතියේ වර්ගයේ | නිෂ්පාදිත රට සහ මාදිලිය (වෙළඳ ලකුණ) | එන්ජිමෙහි සිලින්ඩර ධාරිතාව (සීසී) | නිෂ්පාදිත වර්ෂය | (අදාළ වේ නම්) හඳුනා ගැනීමේ අංකය | අත්කරගත් දිනය | වටිනාකම | (දේපළට සම-අයිතිය ඇත්නම්) සම අයිතිකරු-වන් පිළිබඳ තොරතුරු එක් එක් සම අයිතිකරුට අයිති ප්‍රතිශතය (ස්වභාවික තැනැත්තා හෝ නෛතික තැනැත්තා) | (සන්තකයේ තබා ගැනීමේ හෝ පාවිච්චි කිරීමේ අයිතිය යටතේ දේපළ අත්කරගෙන ඇත්නම්) දේපළෙහි අයිතිකරු පිළිබඳ තොරතුරු (ස්වභාවික තැනැත්තා හෝ නෛතික තැනැත්තා) |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | |

* (1) යතුරුපැදි; (2) මෝටර් ට්‍රයිසිකල්; (3) මෝටර් කාර්; (4) ද්විත්ව කාර්යය වාහන; (5) ඉඩම් වාහන; (6) මෝටර් ලොරි; (7) බස් රථ; (8) ට්‍රේලර් සහ බවුසර්; (9) විශේෂ කාර්යය වාහන; (10) ලොරි ට්‍රේලර්; (11) ප්‍රයිම් මූවර්ස්; (12) ගිලන් රථ; (13) කොඩ්‍රිසයිකල්; (14) ට්‍රැක්ටර්ස්; (15) අවමංගල රථ; (16) වෙනත් විශේෂ කාර්යය වාහන; (17) මෝටර් නිවහන; (18) කෘෂිකාර්මික යන්ත්‍ර; (19) ජලයේ ගමන් කරන වාහන; (20) ගුවනේ ගමන් කරන වාහන; (21) වෙනත් (නිශ්චිතව සඳහන් කරන්න)

5. **සුරැකුම්පත්**

| ආවරණය වන තැනැත්තා | වර්ගය* | අයිතියේ වර්ගය | සුරැකුම්පත නිකුත් කරන්නා (ස්වභාවික තැනැත්තා හෝ නෛතික තැනැත්තා) | අත්කරගත් දිනය සහ අත්කරගත් ආකාරය | වටිනාකම (ප්‍රසිද්ධියේ අලෙවි කළ සුරැකුම්පත් සඳහා මෙය ගොනු කිරීමට පෙරාතුව වූ දිනයේ වූ අවසන් මිල අලෙවි නොකළ මිල දී ගත් සුරැකුම්පත් සඳහා ගෙවූ මිල රික්තවරණ ත්‍යාග හෝ මෙය ගොනු කරනු ලබන අවස්ථාවක දී වන සද්භාවයෙන් සිදුකරන ලද වෙනත් යම් ඇස්තමේන්තු කරන්න) | සුරැකුම්පත් ප්‍රමාණය | කළමනාකරණය කිරීම සඳහා සුරැකුම්පත් පවරන ලද තැනැත්තා පිළිබඳ තොරතුරු (ස්වභාවික තැනැත්තා හෝ නෛතික තැනැත්තා) |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

* සුරැකුම්පතක් යනු රාජ්‍ය සහ පෞද්ගලික වෙළඳපොළවල්හි ප්‍රාග්ධනය ඉහළ නැංවීම සඳහා භාවිත කරනු ලබන ප්‍රතිමෝජනය කළ හැකි මූල්‍යමය සාධන පත්‍රයකි.
(1) කොටස්; (2) ණය සුරැකුම්පත්; (3) සාංගමික බැඳුම්කර; (4) මහ බැංකු බැඳුම්කර; (5) භාණ්ඩාගාර බැඳුම්කර; (6) බදු සංචිත සහතිකපත්; (7) බැඳීම්; (8) ඉතිරි කිරීමේ (තැන්පතු) සහතික; (9) පොරොන්දු නෝට්ටු; (10) ජාත්‍යන්තර මූල්‍ය ආයතනවල බැඳුම්කර; (11) විදේශීය රජයන්ගේ බැඳුම්කර; (12) ස්වභාවික තැනැත්තන්ගේ බැංකු තැන්පතු අරමුදලේ බැඳුම්කර; (13) චෙක්පත්; (14) ආයෝජන සහතික; (15) උකස් සුරැකුම්පත්; (16) උකස් බැඳුම්කර; (17) උකස් සහතික; (18) උකස් ඇපකර; (19) ව්‍යුත්පන්න; (20) පුද්ගලකරණය කළ සුරැකුම්පත් (වවුචර ආදිය); (21) භාණ්ඩවල හිමිකම් ලේඛන; (22) වෙනත් වර්ගය (නිශ්චිතව සඳහන් කරන්න)

6. **සාංගමික හිමිකම්**

**ප්‍රකාශයට පත්කළ යුතු දේ:** ඉහත "5. සුරැකුම්පත්" ශීර්ෂය යටතේ වන වගුවේ සඳහන් කර ඇති සුරැකුම්පත්වලට අමතරව සීමිත හෝ පොදු හවුල්කාරීත්වයන්හි හෝ ණය දෙන සමිතිවල කොටස් ද ඇතුළුව සහ යම් කොටස් හිමිකම් ද ඇතුළුව ශ්‍රී ලංකාවේ හෝ විදේශ රටක ලියාපදිංචි කරන ලද නෛතික ආස්ථිත්‍යවල ව්‍යවස්ථාපිත ප්‍රාග්ධනයට සමාන වෙනත් යමක්.

| ආවරණය වන තැනැත්තා | ප්‍රකාශකට කොටස් අයත් කොටස් සහ ආස්ථිත්‍යයේ නම | ආස්ථිත්‍යයේ ප්‍රධාන කාර්යයාලය ලියාපදිංචි රට | ආස්ථිත්‍යයේ සංවිධානාත්මක සහ නෛතික ආකෘතිය | ලියාපදිංචි කිරීමේ විස්තර | අයිතියේ වර්ගය | ප්‍රාග්ධනය හෝ එයට සම වූවක නෛතික පුද්ගලයාට හිමි කොටස | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | මූල්‍යමය පදනමින් (වටිනාකම) | | ප්‍රතිශතයක් ලෙස (%) |
| | | | | | | සමස්ත | පසුගිය වර්ෂයේ දී අත්පත් කර ගැනීම | |
| | | | | | | | | |

7. **ස්පර්ශ කළ නොහැකි වත්කම් හා බලපත්‍ර**

ස්පර්ශ කළ නොහැකි වත්කම් යටතට බුද්ධිමය දේපළ අයිතිය (නව නිපැයුම්, ප්‍රයෝජනවත් ආකෘති, දැනුම, කාර්මික සැලසුම් හෝ නව ශාක ප්‍රභේද, වෙළඳ ලකුණ හෝ වෙළඳ නාමය, ප්‍රකාශන අයිතිය, පේටන්ට් බලපත්‍ර යනාදිය සඳහා ඇති හිමිකම), යටිපස හා වෙනත් ස්වභාවික සම්පත් ප්‍රයෝජනයට ගැනීම සඳහා ඇති අයිතිය හෝ වෙනත් යමක් (නිශ්චිතව සඳහන් කරන්න) අයත් වේ.

| ආවරණය වන තැනැත්තා | වර්ගය (බුද්ධිමය දේපළ හිමිකම (වර්ගය නිශ්චිතව සඳහන් කරන්න) යටිපස හා වෙනත් ස්වභාවික සම්පත් ප්‍රයෝජනයට ගැනීම සඳහා අයිතිය/ වෙනත් (නිශ්චිත සඳහන් කරන්න) | අයිතිවාසිකමේ අරමුණ පිළිබඳ විස්තරය (වත්කම සඳහා හිමිකම සහතික කරන නිල ලියවිල්ලට අනුව - අදාළ වේ නම් එම නිල ලියවිල්ලේ පෙළ සහ අංකය සඳහන් කරන්න) | හිමිකම් වර්ගය | අත්කර ගත් දිනය | අත්කරගත් ආකාරය | වටිනාකම |
|---|---|---|---|---|---|---|
| | | | | | | |

8. ආදායම

8.1 ත්‍යාග හැර වෙනත් ආදායම්

| ආවරණය වන තැනැත්තා | ආදායම් වර්ගය* | හිමිකම් වර්ගය | ආදායම් මූලාශ්‍රය (ස්වභාවික තැනැත්තා හෝ නෛතික තැනැත්තා) | පූර්ව ලිත් වර්ෂයේ දී ඉපයූ මුදල් ප්‍රමාණය |
|---|---|---|---|---|
| | | | | |

* ආදායම් යන්නෙන්, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 4, 5, 6, 7 සහ 8 වන වගන්තිවල නිශ්චිතව දක්වා ඇති තක්සේරු කළහැකි ආදායම අදහස් වන අතර, ඊට, (1) වැටුප (දිරි දීමනා සහ වන්දි ගෙවීම් ඇතුළත් මූල්‍යමය දීමනා; (2) ගරු දීමනා හෝ ගිවිසුම්වලට අනුව සිදුකරන වෙනත් ගෙවීම්; (3) ව්‍යවසායක කටයුතුවලින් ලැබෙන ආදායම; (4) ස්වාධීන වෘත්තීමය කටයුතුවලින් ලැබෙන ආදායම (නිශ්චිතව සඳහන් කරන්න); (5) ඉඩකඩම් විකිණීමෙන් ලැබෙන ආදායම (සුරැකුම් හැර); (6) චංචල දේපළ විකිණීමෙන් ලැබෙන ආදායම; (7) දේපළ බදු දීමෙන් ලැබෙන ආදායම; (8) ලාභාංශ; (9) පොළිය; (10) කතෘ භාග; (11) රක්ෂණ ගෙවීම්; (12) පුණ්‍යාධාර; (13) විශ්‍රාම වැටුප; (14) උරුමයෙන් ලැබෙන ආදායම; (15) සුරැකුම්පත් සහ කොටස් විකිණීමෙන් ලැබෙන ආදායම(වර්ගය නිශ්චිතව සඳහන් කරන්න) ; (16) අනුග්‍රාහිත සංචාර සහ සේවාවලින් ලැබෙන ආදායම්; (17) වාහන; (18) ශිෂ්‍යත්ව; (19) වෙනත් ආදායම් (නිශ්චිතව සඳහන් කරන්න); (20) රාජ්‍ය ආස්ථිත්‍ය සමග ඇතිකරගත් ගිවිසුම්, ආදිය නිදර්ශන ලෙස දැක්විය හැකි නමුත් ඒවාට සීමා නොවන ආදායම් ඇතුළත් වේ.

8.1 ත්‍යාග ඇතුළු සංචාර ප්‍රතිපූරණයන්

ඉහත සඳහන් කර තිබුණ ද, පවුලේ සමීපතම සාමාජිකයකු නොවන යම් තැනැත්තකගෙන් හෝ ආයතනයකින් පසුගිය වර්ෂයේ දී සමස්ත අගය රුපියල් පනස්දහසක් (රු. 50,000.00) ඉක්මවා එක් තනි මූලාශ්‍රයකින් ලද සංචාර ප්‍රතිපූරණ ඇතුළු යම් ත්‍යාග ලැයිස්තුගත කරන්න.

| ලබන්නා | ත්‍යාගය පිළිබඳ විස්තරය | ලද දිනය | කවරකුගෙන්ද යන වග | වටිනාකම පිළිබඳ සද්භාවීය ඇස්තමේන්තුව |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |

9. මූල්‍යමය වත්කම්

ප්‍රකාශයට පත්කළ යුතු වත්කම්: මුදල්, ඩිජිටල් ව්‍යවහාර මුදල්, බැංකු ගිණුම්වල ඇති අරමුදල්, ණය දෙන සමිති සහ අන්‍යොන්‍ය ආයෝජන ආයතන ඇතුළු බැංකු නොවන මූල්‍යමය ආයතනවලට සිදුකර ඇති දායකත්ව මුදල්, තුන්වන පාර්ශවය සඳහා ලබා දී ඇති ණය ; වටිනා ලෝහ ආකාරයෙන් ඇති වත්කම් (බැංකුවල පවතින) සහ වෙනත්6 නිශ්චිතව සඳහන් කරන්න).

| ආවරණය වන තැනැත්තා | වර්ගය* | අයිතිවාසිකමේ වර්ගය | මුදල් ප්‍රමාණය | ව්‍යවහාර මුදල් | අදාළ ගිණුම විවෘත කර ඇති හෝ මුදල් තැන්පත් කරනු ලබන ආස්ථිත්‍ය ශ්‍රී ලංකාවේ හෝ විදේශ ආස්ථිත්‍යයක ලියාපදිංචි වූ තැනැත්තකු | මුදල් ණයට දෙනු ලැබ ඇති තැනැත්තා හෝ ආස්ථිත්‍යය |
|---|---|---|---|---|---|---|
| | | | | | | |

* (1) මුදල්; (2) ඩිජිටල් ව්‍යවහාර මුදල්; (3) බැංකු ගිණුම්වල ඇති අරමුදල් (ගිණුම් අංකය සඳහන් කරන්න); (4) අන්‍යෝන්‍ය ආයෝජන ආයතන ඇතුළු ණය දෙන සමිති සහ බැංකු නොවන මූල්‍යමය ආයතනවලට සිදු කර ඇති දායකත්ව මුදල් (ආයතනයේ වර්ගය සහ ගිණුම් අංකය සඳහන් කරන්න); (5) තෙවන පාර්ශ්වවලට ණයට ලබා දී ඇති මුදල්; (6) වටිනා ලෝහ ආකාරයෙන් ඇති වත්කම්; (7) වෙනත් (නිශ්චිතව සඳහන් කරන්න)

10. මූල්‍ය බැඳීම්

බැඳීම් වටිනාකමෙහි සමස්ත අගය රුපියල් ලක්ෂ පහ (රු. 500,000.00) ඉක්මවන්නේ නම් සඳහන් කරන්න.

| ආවරණය වන තැනැත්තා | අයිතමය | වර්ගය* | මුදල් ප්‍රමාණය | මුදල් වර්ගය | බැඳීම ඇති වූ තැනැත්තා (ස්වභාවික තැනැත්තා හෝ නෛතික තැනැත්තා | බැඳීම ඇති වූ දිනය | පියවිය යුතු දිනය | බැඳීම සඳහා සිටින ඇපකරුවන් පිළිබඳ තොරතුරු (ඇපකරුවෙක් මගින් බැඳීම සුරක්ෂිත කර ඇත්නම්) |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | |

* (1) ලැබූ ණය මුදල්; (2) ලැබූ ණය; (3) කල්බදු ගිවිසුම් යටතේ වන බැඳීම්; (4) මූලික ණය මුදලේ කොටස වශයෙන් ගෙවන මුදල් ප්‍රමාණය; (5) ණය මුදලේ පොලිය සඳහා ගෙවන ලද මුදල් ප්‍රමාණය/රක්ෂණ ගිවිසුම යටතේ වූ බැඳීම්; (6) රාජ්‍ය නොවන විශ්‍රාම වැටුප් ලබාදීමේ ගිවිසුම යටතේ වන බැඳීම; (7) වෙනත් තැනැත්තන් විසින් ප්‍රකාශක වෙත ණයට ලබා දුන් මුදල; (8) වෙනත් තැනැත්තන් විසින් ප්‍රකාශක නොවන ආවරණය වන තැනැත්තන් වෙත ලබා දෙන ලද මුදල්; (9) හිඟ බදු මුදල්; (10) වෙනත් (නිශ්චිතව සඳහන් කරන්න)

11. **වෙනත් ගණුදෙනු (ඉහත ශීර්ෂ යටතේ වන වගුවලින් ආවරණය නොවූ)**

| ආවරණය වන තැනැත්තා | ගනුදෙනු වර්ගය* | ගනුදෙනුවේ අරමුණ** | ගනුදෙනුවේ අනෙක් පාර්ශ්වය පිළිබඳ තොරතුරු |
|---|---|---|---|
| | | | |

* ආවරණය වන තැනැත්තාගේ හිමිකම් අයිතිවාසිකම් මගින් ලබා ගැනීමෙන් ජනිත වූ ගනුදෙනුව (හවුල් හිමිකම ද ඇතුළුව); සන්තකය හෝ භුක්තිය ලබා ගැනීමේ දී සිදු වූ ගනුදෙනුව/ ප්‍රකාශකගේ හිමිකම් අයිතිවාසිකම, සන්තකය හෝ භාවිතය අවසාන වීම/ ආවරණය වන තැනැත්තාගේ මූල්‍යමය බැඳීම (නිශ්චිතව දක්වන්න)

** (1) දේපළ ඉඩකඩම්; (2) ඉඩම් කට්ටිය; (3) නේවාසික ගොඩනැගිලි; (4) බද්ධ නිවාස; (5) වාණිජ ගොඩනැගිලි; (6) ගරාජය; (7) වෙනත් දේපොළ(නිශ්චිතව සඳහන් කරන්න); (8) චංචල දේපොළ; (9) වාහන; (10) සුරැකුම්පත්; (11) මූල්‍යමය වත්කම්; (12) ආභරණ; (13) පුද්ගල සහ ගෘහ විදුලි උපකරණ; (14) ඇඳුම්; (15) පශු සම්පත්; (16) රන්, රිදී, ප්ලැටිනම් හෝ වෙනත් යම් වටිනා ලෝහ; (17) පෞරාණික භාණ්ඩ; (18) සිතුවම්; (19) වෙනත් දේපළ (නිශ්චිතව සඳහන් කරන්න); (20) ස්පර්ශ කල නොහැකි වත්කම් (නිශ්චිතව දක්වන්න); (21) සංචාරක (පවුලේ සියලු සාමාජිකයන්ගේ මුළු සංඛ්‍යාව; (22) අධ්‍යාපනය (පෞද්ගලික පාසල් හෝ විශ්ව විද්‍යාල); (23) විනෝදාස්වාදය.

**12. ආවරණය වන තැනැත්තා රජයේ හෝ පෞද්ගලික ආයතනයක හෝ ඒවායේ පාලක මණ්ඩලවල දරන තනතුරු හෝ සාමාජිකත්වයන්**

**ප්‍රකාශයට පත් කළ යුතු දේ:** ප්‍රජා සමාගම්, පුණ්‍යායතන, ස්වයං-නියාමක හෝ ස්වයං-පාලක වෘත්තීමය සංවිධානයන්හි කළමනාකරණ, විගණන හෝ අධීක්ෂණ මණ්ඩලයක සාමාජිකයකු වශයෙන් ආවරණය වන තැනැත්තා සහභාගිවීම සහ එවැනි සමාගම් (සංවිධාන) වල දරනු ලබන සාමාජිකත්වය.

යම් කාලසීමාවක් සඳහා වාර්තා කරන කාල පරිච්ඡේදය අතරතුරදී ආවරණය වන තැනැත්තා එම සංවිධානයේ විශේෂිත තනතුරක් දැරුවේ නම් හෝ සාමාජිකයකු වී සිටියේ නම් පහත දැක්වෙන තොරතුරු සඳහන් කල යුතු ය.

| ආවරණය වන තැනැත්තා | සංවිධානයේ/ මණ්ඩලයේ නම | නෛතික හා සංවිධානමය ස්වභාවය* | ලියාපදිංචිය පිළිබඳ විස්තර |
|---|---|---|---|
| | | | |

* (1) ප්‍රජා සමාගම්; (2) පුණ්‍යායතන; (3) ස්වයං නියාමක හෝ ස්වයං-පාලක වෘත්තීමය සංවිධාන; (4) භාරකාර මණ්ඩල හා පදනම්; (5) පුද්ගලික අංශය හෝ රාජ්‍ය අංශය විසින් හිමිකාරීත්වය දරන ව්‍යාපාර; (6) පොදු හෝ සීමිත හවුල් ව්‍යාපාර; (7) වෙනත් යම් වර්ගයක නෛතික තැනැත්තන් (නිශ්චිතව සඳහන් කරන්න)

**13. භාරයන්**

භාරයක, ඒ හා සමාන නෛතික ආස්ථිත්‍යයක හෝ ගිවිසුම්ගත විධිවිධානයකින් ආවරණය වන තැනැත්තා සඳහා යම් පුද්ගයකු හෝ ආස්ථිත්‍යයක් යම් වත්කමක් තබා ගන්නේ ද? එසේ නම් ඒ භාරය, ආස්ථිත්‍ය හෝ ගිවිසුම්ගත විධිවිධාන ස්තාපිත කරන සියලු ලේඛනවල පිටපතක් ලබා දී ලේඛනයේ සඳහන් පරිදි පහත තොරතුරු ලැයිස්තුගත කරන්න :-

| භාරකරුගේ නම/ සම්බන්ධ කර ගැනීමේ තොරතුරු (ලිපිනය, දුරකථන අංකය ආදිය) | වත්කම් | භාර කතෘගේ නම/ සම්බන්ධ කර ගැනීමේ තොරතුරු | ප්‍රතිලාභීන් සියල්ලන්ගේ නම් | භාරය ආරක්ෂා කරන්නා/කරන්න-න්ගේ බලාත්මක කරන්නා/ කරන්නන්ගේ හෝ භාරකරු කෙරෙහි බලය ඇති වෙනත් තෙවන පාර්ශ්වයන්ගේ | අදාළ වන නීතිය |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |

ආවරණය වන යම් තැනැත්තකු වෙනත් යම් තැනැත්තකු වෙනුවෙන් යම් දේපළක භාරකාරත්වය දරන්නේ ද? එසේ නම්, ඊට අදාළව ඉහත ඉල්ලා ඇති තොරතුරු සපයන්න.

දිවුරුම/ප්‍රතිඥාව

...................................................... වන මම මෙහි සපයා ඇති පිළිතුරු සහ සිදු කර ඇති ප්‍රකාශ සත්‍ය හා නිවැරදි බවත්, වෙනත් පාර්ශ්වයක කිසිදු බලපෑමකින් හෝ බල කිරීමකින් තොරව, මෙම වත්කම් සහ බැරකම් ප්‍රකාශ කිරීම සත්‍යවාදී ලෙස සිදු කළ බවත්, ගෞරව බහුමානයෙන් යුක්තව, අවංකව හා සත්‍ය ලෙස ප්‍රකාශ කර ප්‍රතිඥා දෙමි/ දිවුරුම් දෙමි.

ප්‍රකාශ නොකළ වත්කම් සහ/හෝ සාවද්‍ය ප්‍රකාශ පිළිබඳව අනාවරණය වුවහොත්, එහි නෛතික ප්‍රතිවිපාක පිළිබඳ මා මැනවින් දැනුවත්ව සිටිමි.

20.................. වර්ෂයේ ....................... මස ........................ දින මා ඉදිරිපිට දිවුරුම්/ ප්‍රතිඥා දෙන ලදී.

දිවුරුම් කොමසාරිස්/ සාමදාන විනිශ්චයකාර

**විස්තරාත්මක සටහන්**

(1) ඉල්ලා ඇති තොරතුරු සඳහන් කිරීම සඳහා මෙම ආකෘති පත්‍රයේ යම් තීරුවක ඉඩකඩ ප්‍රමාණවත් නොවන්නේ නම්, එම තොරතුරු වෙනම උපලේඛනයක හෝ උපලේඛනවල දැක්විය හැකි අතර, එහි ප්‍රතිඵලයක් වශයෙන් ඊට ඇඳෙන ඕනෑම උපලේඛනයක් සඳහා සුදුසු මූලාශ්‍ර දැක්වීම සිදු කරනු ලැබිය යුතු ය. එම උපලේඛන ඔබ විසින් ද අත්සන් කළ යුතුය.

(2) මෙම ආකෘති පත්‍රයේ ඕනෑම කොටසක් තුල සටහන් කිරීමට තොරතුරු කිසිවක් නොමැති නම්, අදාළ ඉඩකඩ තුළ කරුණාකර "කිසිවක් නැත" යනුවෙන් ලියන්න.

(3) වැඩිදුර පැහැදිලි කර ගැනීමේ කාර්යය සඳහා කරුණාකර 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ II වන කොටස බලන්න.

EOG 03 - 0181

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.